# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/283/2025 (PSC)**

ආර්.එම්.සුනිල් රත්නායක
**අභියාචක**

**එදිරිව,**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය : 2026.01.07**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

**-නියෝගය-**

**විනිසුරු කේ.ටී. චිත්‍රසිරි මැතිතුමා**

මෙම අභියාචනය 2025.12.03 දින ප්‍රථම වරට මෙම විනිශ්චය සභාව ඉදිරියේ කැඳවූ අවස්ථාවේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් කරුණු දැක්වූ එල්.එල්.සී. ලොකුගේ මිය විසින් දන්වා සිටියේ, මෙම අභියාචනය ඉදිරිපත් කරන අවස්ථාව වන විට අභියාචක රාජ්‍ය සේවකයකු නොවන බවයි. ඒ අනුව එම අවස්ථාව වන විට ඔහු විශ්‍රාමික තත්ත්වයට පත්ව ඇති බැවින් අභියාචනා විනිශ්චය අධිකාරී පනතේ විධි විධාන අනුව මෙම විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට අභියාචකට නීතියෙන් බලය පැවරී නොමැති බවට ඇය විසින් තවදුරටත් කරුණු දක්වන ලදී.

මෙම තත්ත්වය එම අවස්ථාවේදීම අභියාචක වෙත දැනුම් දෙන ලදී. එය එසේ වුවත් අභියාචක ඉල්ලා සිටියේ ඒ සම්බන්ධයෙන් කරුණු දැක්වීමට ඔහුට අවස්ථාවක් ලබා දෙන ලෙසයි. ඒ අනුව ඒ සඳහා අවස්ථාව ලබා දෙමින් එකී කරුණු දැක්වීම 2025 දෙසැම්බර් මස 31 දිනට පෙර ඉදිරිපත් කරන ලෙස ඔහුට

දැනුම් දෙන ලදී. ඒ අනුව එකී ලිඛිත දේශන 2025 දෙසැම්බර් 31 දින මෙම විනිශ්චය අධිකාරය වෙත අභියාචක විසින් එවා ඇත. අභියාචකගේ එකී ලිඛිත දේශනය ඡේද 22කින් සමන්විත වේ. එකී සියළුම ඡේදයන්හි සඳහන් කර ඇත්තේ, අභියාචක 2001.07.16 දින සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පත්වීම් ලැබීමෙන් අනතුරුව ඔහුගේ සේවය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගයන් පිළිබඳවය. එම දේශනවල කිසිඳු ස්ථානයක 2025.12.03 දින ඉදිරිපත් කරන ලද නීතිමය කරුණ සම්බන්ධයෙන් කිසිඳු සඳහනක් කර නැත. ඒ අනුව පෙනී යන්නේ පසුගිය දින අභියාචක වෙත දැනුම් දුන් නීතිමය කරුණ සම්බන්ධයෙන් කිසිදු කරුණු දැක්වීමකට ඔහු සමත් නොවන බවයි.

මේ අවස්ථාවේදී ඉහත කී නීතිමය තත්ත්වය පිළිබඳව පැහැදිළි කළ යුතුය. 2002 අංක 4 දරණ පරිපාලන විනිශ්චය අධිකාරය පනතේ 4(I) වගන්තියට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණයකින් අතෘප්තියට පත් රජයේ නිළධරයකු හෝ පොලිස් නිළධරයකු විසින් ඒ නියමය හෝ තීරණය ඔහුට ලැබුණ දින සිට සති හතරක් ඇතුළත, ලියවිල්ලකින් වූ අභියාචනයක් විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කළ යුතුය. එයින් හැඟී යන්නේ එම ඉල්ලීම කළ හැකි වන්නේ, රාජ්‍ය නිළධරයකු හෝ පොලිස් නිළධාරියකු විසින් පමණක්ම වන බවයි. "රජයේ නිළධාරියකු" යන වචන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාවේ සහ ආයතන සංග්‍රහයේ I වන ඡේදයේ අර්ථ නිරූපණය කර ඇති පරිදි, රාජ්‍ය සේවකයකු යන ගනයට යම් කිසිවකු ඇතුළත් වන්නේ, එම තැනැත්තා රජයේ නිළයක් දරමින් සහ රජයෙන් වැටුපක් ලබමින් සිටිය යුතු වන බවටයි. කිසියම් පුද්ගලයකු විශ්‍රාමික තත්ත්වයට පත් වූ විට ඔහු රජයේ නිළයක් දරන්නේ නැත. එවැනි අයෙකුට රජයෙන් වැටුපක් ලෙස මුදලක් ගෙවන්නේද නැත. එබැවින් විශ්‍රාමික පුද්ගලයකු රජයේ නිළධරයකු ගනයේ ලා සැලකිය නොහැක. එසේ නම් ඉහත කී පනතේ 4 වන වගන්තිය යටතේ වන ප්‍රතිපාදනය අනුව, විශ්‍රාමික තැනැත්තකු වන අභියාචක "රජයේ නිළධරයකු" යන ගනයට ඇතුළත් වන්නේ නැත. එසේ නම් විශ්‍රාමික තත්ත්වයට පත්වී ඇති අභියාචකට 2002 අංක 4 දරන පරිපාලන විනිශ්චය අධිකාරී පනතේ විධිවිධාන උපයෝගී කර ගනිමින් මෙම විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට නීතියෙන් අවකාශ ලැබෙන්නේ නැත.

ඉහත කරුණු සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය නිශ්ප්‍රභා කරමු.

මෙම නියෝගය ලියාපදිංචි තැපැල මඟින් පාර්ශ්වකරුවන්ට දන්වා යවන ලෙස, විනිශ්චය අධිකාරයේ ලේකම්වරයාට නියෝග කරමු.

| | | |
|---|---|---|
| විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | ජේ.ජේ.රත්නසිරි | එස්.නන්දසේකරන් |
| (සභාපති) | (සාමාජික) | (සාමාජික) |

දෙව්මිනි/